අබූ බක්ර් සිද්දීක් -රළියල්ලාහු අන්හු- තුමා සතුව වහල් දරුවකු විය. එතුමා ඔහු වෙනුවෙන් දෛනික දීමනාවක් නිකුත් කරයි. එම දෛනික දීමනාවෙන් අබූ බක්ර් තුමා ද අනුභව කරන්නෙකු වූහ.

ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලදී. අබූ බක්ර් සිද්දීක් - රළියල්ලාහු අන්හු- තුමා සතුව වහල් දරුවකු විය. එතුමා ඔහු වෙනුවෙන් දෛනික දීමනාවක් නිකුත් කරයි. එම දෛනික දීමනාවෙන් අබූ බක්ර් තුමා ද අනුභව කරන්නෙකු වූහ. දිනක් යමක් ඔහු ගෙන ආවේය. එවිට අබූ බක්ර් තුමා එයින් අනුභව කළහ. එවිට එම වහල් දරුවා මේ කුමක් දැයි ඔබ දන්නෙහිද යැයි එතුමාගෙන් විමසීය. එවිට අබූ බක්ර් තුමා මේ කුමක් දැයි විමසා සිටියහ. එවිට ඔහු: ජාහිලියා යුගයේ මම මිනිසෙකුට නිමිති කීවෙමි. සැබැවින්ම මම ඔහුට වංචාවක් කළාක් මිස මනා ලෙස නිමිතිකීමට මම නොදනිමි. පසුව ඔහු මා හමුවිය. එවිට ඒ වෙනුවෙන් ඔහු මට ඔබ අනුභව කළ දෑ පිරිනැමීය යැයි පැවසීය. එවිට අබූ බක්ර් තුමා තම අත කට තුළට දමා තම කුසේ ඇති සියලු දෑ වැමෑරූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

අබූ බක්ර් සතු මේ වහල් කොලුවාට තමන් වෙත යමක් ගෙන එන්නට දෛනිකව නියමිත දීමනාවක් එතුමා නිකුත් කළහ. දිනක් මෙම කොලුවා අබූ බක්ර් තුමා වෙනුවෙන් ආහාරයක් ගෙන ආවේය. පසුව එතුමා එය අනුභව කළහ. එවිට ඔහු, මේ කුමක්දැයි ඔබ දන්නෙහිද? යැයි ඇසුවේය. එතුමා: මෙය කුමක්දැයි: විමසූහ. මෙය නිමිති කීමේ කුලිය වෙනුවෙන් ලැබූ දෙයකි. අඥාන යුගයේ මම නිමිතිකීවෙමි. නමුත් යහපත් අයුරින් නිමිති කීමේ හැකියාව මට නොතිබිනි. නමුත් මම එම පුද්ගලයාව රවටා දැමුවෙමි. ඔහු මා මුණ ගැසී එය මට පිරිනැමුවේය. නිමිතිකීම වෙනුවෙන් ලබන දෑ හරාම් හෙවත් තහනම්ය. එසේ නිමිති කියන්නා තම නිමිත්ත නිවැරදිව කිව්වද එය නිවැරදිව කීමට නොහැකි වූවද තහනම් වන්නේය. හේතුව නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පේන කියන්නාගෙන් ලැබෙන සුවය තහනම් කළහ. -මෙය ඉමාම් බුහාරි තම සහීහ් ග්රන්ථයේ වාර්තා කොට ඇත. (3/84 අංකය 2237) ඉමාම් මුස්ලිම් තුමාද එතුමාගේ සහීහ් ග්රන්ථයේ මෙය වාර්තා කොට ඇත. (3/1198 අංකය 1567) අබූ මස්ඌද් අල් අන්සාරි තුමාගේ හදීසය අනුව. අබූ බක්ර් තුමාට මෙම ප්රකාශය කියූ කල්හි අබූ බක්ර් තුමා තම අත තම කට තුළට දමා තමන් අනුභව කළ සියල්ල වැමෑරූහ. තම කුසෙහි තහනම් දෙයක් ආහාර වශයෙන් පත් නොවනු පිණිස තම කුසෙන් බැහැර කළහ. මෙම මුදල හරාම්ය. හේතුව හරාම් දෙයක් වෙනුවෙන් ලැබූ මුදලකි. තහනම් ක්රියාවක් සිදු කොට ලබන කුලියද හරාම් වේ.

http://www.sunnah.global/hadeeth/si/show/6187